

**ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?**

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිමය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

### ප්‍රධාන අවශ්‍යතා

- පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම එක් සුදුසුකමක් ලබා තිබීම
  - (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක්
    හෝ
  - (ආ) බැංකු හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය.
- බැංකුකරණය පිළිබඳ වසර 10 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතුය.
- සංවර්ධන බැංකුකරණය, බැංකු මෙහෙයුම් කටයුතු, ණය අවදානම් කළමනාකරණය, බැංකු ව්‍යාපාර කටයුතු පිළිබඳ මූල්‍ය හා අලෙවිකරණ හැකියාවන් ලබා තිබිය යුතුය.
- විශිෂ්ඨ මානව සම්පත් කළමනාකරණ හා නායකත්ව කුසලතා සහිත විය යුතුය.
- වයස අවුරුදු 60 ට වඩා අඩු වීම.

### වැටුප් පරිමාව

තෝරාගන්නා ලද අයදුම්කරු බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

### අයදුම් කළ යුතු ආකාරය

ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඥාතීන් නොවන වෘත්තිමය පුද්ගලයන් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු ද සහිතව විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර, 2023 ජුනි 21 දින හෝ ඊට පෙර careers@rdb.lk ඊ මේල් ලිපිනයට යොමු කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

**ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.**
0112 42 52 62 | www.rdb.lk